(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 4(2).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2011 අගෝස්තු මස 26 වැනි සිකුරාදා**

## 2011 සැප්තැම්බර් මස 06 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 1),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 ජූනි 29 දිනැති අංක 1660/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 2),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 මාර්තු 24 දිනැති අංක 1646/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 3),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 මාර්තු 24 දිනැති අංක 1646/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 4),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 5),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2009 සැප්තැම්බර් 01 දිනැති අංක 1617/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 6),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2011 පෙබරවාරි 23 දිනැති අංක 1694/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

අධිකරණ අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*

කාර්මික ආරවුල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2011 සැප්තැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1050/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි මහනුවර දිස්ත්‍රික්කයේ කටුගස්තොට, ගම්පොල, තෙල්දෙනිය, වත්තේගම, දෙනුවර සහ මහනුවර යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 61 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්ත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1534/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය - නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවතින පූම්පුකාර් ගම්මානයේ පාසලක් මේ වන විට පෞද්ගලික නිවසක පවත්වාගෙන යනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) පවුල් 50කට වැඩි සංඛ්‍යාවක් නැවත පදිංචිකර ඇති මෙම ගම්මානයේ පවුල්වල දරුවන්ගේ අනාගත අධ්‍යාපන අභිවෘද්ධිය සැලකිල්ලට ගෙන ස්ථිර පාසල් ගොඩනැගිල්ලක් ඉදිකරදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1565/'11

ගරු අනෝමා ගමගේ මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ හා තදාසන්න ප්‍රදේශවලින් පිට ප්‍රාදේශීය පරිපාලනයේ යෙදෙන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් වැනි තනතුරු දරන රාජ්‍ය නිලධාරීන් සඳහා නිල නිවාස ලබාදිය යුතු බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ එක් එක් පන්තියට අයත් නිලධාරීන් සඳහා අනුමත නිල නිවාස වර්ගීකරණය කර කර ඇති පදනම කවරේද;

(ii) ඉහත නිලධාරීන්ට ලබා දීම සඳහා අලුතින් නිල නිවාස ඉදිකරන්නේ නම්, ඒ සඳහා අනුමත සැලැස්මක් තිබේද;

(iii) එසේ නම්, එකී සැලැස්මෙහි නිවාස වර්ගීකරණය කර ඇති පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1535/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය - කිළිනොච්චිය ප්‍රදේශවල පානීය ජල ප්‍රශ්නය විසඳීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර පවත්වන ලද සාකච්ඡාවන්හි ප්‍රතිඵල කවරේද;

(ii) යාපනය - කිළිනොච්චිය පානීය ජල යෝජනා ක්‍රමය ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 සැප්තැම්බර් මස 20 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0880/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සම්පූර්ණ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද;

(ආ) එම එක් එක් වර්ෂයේදී,

(i) දේශන ගාස්තු වශයෙන් අයකර ගන්නා ලද මුදල;

(ii) නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ අයදුම්පත් ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iii) එම විභාගයේ විභාග ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iv) වෙනත් ක්‍රම මගින් ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ලැබුණු ආදායම;

(v) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ වියදම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය විධිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) 2009 වර්ෂය සඳහා අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවේ දක්වා ඇති පරිදි දේශන ගාස්තු වැඩිකිරීමකින් තොරව ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යෑමට නොහැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1165/'11

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) වර්ෂ 1980 සිට 2011 පෙබරවාරි මාසය දක්වා රජයේ සේවකයින් සංඛ්‍යාව වැඩිවී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාල සීමාව තුළ ජීවන වියදම් දර්ශකය වැඩි වී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහළ යන ජීවන වියදමට සාපේක්ෂව රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩිවී නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1608/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, කෙසෙල්වත්ත, දිග්ගල තොටුපල සහ කොළඹ දිස්ත්‍රික්කයේ පිළියන්දල, තුඩුව අතර යෙදවීමට නියමිත පාලම් පාරුව බණ්ඩාරගම, හිරණ තොටුපලේ සිට දිග්ගල තොටුපලට රැගෙන එන ලද දිනය කවරේද;

(ii) එකී පාලම් පාරුව මෙතෙක් භාවිතය සඳහා යෙදවීමට නොහැකිවීමට හේතු කවරේද;

(iii) එම පාලම් පාරුව ගමනාගමනය සඳහා භාවිතා කිරීම ආරම්භ කිරීමට යෝජිත දිනය කවරේද;

(iv) පාලම් පාරුව භාවිතය ආරම්භ කිරීම සඳහා ඉලක්කගත දිනයක් නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2011 සැප්තැම්බර් මස 20 වැනි අඟහරුවාදා)**

1631/'11

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැළැක්වීම් පනත යටතේ,

(i) යම් කිසි ඉල්ලීමක් මත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනය අවසන් වන තෙක් අධිකරණය විසින් අතුරු ආරක්ෂණ නියෝගයක් නිකුත් කළ යුතු බවත්;

(ii) ඉල්ලීම ඉදිරිපත් කළ දින සිට දින 14ක් ඇතුළත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමට අධිකරණය විසින් නියෝගයක් නිකුත් කළ හැකි බවත්; සහ

(iii) අතුරු ආරක්ෂණ නියෝගයක් මාස 12 නොඉක්මවන කාල සීමාවක් සඳහා බල පැවැත්වෙන බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) එම නම් කරන ලද කාල සීමාවට පසු විමර්ශන නොපැවැත්වූ යන විමර්ශන පැවැත්වූ නඩු කවරේද;

(ii) මෙම නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවූ මහේස්ත්‍රාත්වරුන්ට මග පෙන්වීම සඳහා යොදා ගන්නා ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ එම නිසා ප්‍රමාදයන්ට ලක්වූ වින්දිතයන්ට ගෙවීමට තිබෙන වන්දි ප්‍රමාණය කවරේද;

(iii) අතුරු නියෝග නොවන නියෝග සඳහා අවසන් දිනයක් තිබීමටත්, අතුරු නියෝග සඳහා එවන් දිනයක් නොතිබීමටත් හේතුව කවරේද;

(iv) එම විෂමතාව නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1632/'11

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2001 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී, 1841 අයාල ආඥාපනත යටතේ අත්අඩංගුවට ගත් සහ රක්ෂිත බන්ධනාගාරගත කළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කොට සිටි අය අතුරින් තවමත් බන්ධනාගාරගතව සිටින හෝ වෙනත් ස්ථානවල රඳවා සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අයාල ආඥාපනතෙහි සඳහන් වන "නිවැරදි කළ නොහැකි නොදැමුණු පුද්ගලයන්" (Incorrigible Rogues) යන පදයෙහි අර්ථය කවරේද;

(ii) එම පදය භාවිතාකොට ඇත්තේ කවර අරමුණකින්ද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයාල ආඥාපනතට සිදු කරන ලද වෙනස්කම් පිළිබඳව 2004 වසරේදී මානව හිමිකම් කොමිසම ඉදිරියේ නිර්දේශ ඉදිරිපත් කරන ලද බව පිළිබඳව සහ ඒවා භාවිතා කරන ආකාරය එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා පියවර ගනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, එම ආඥාපනත යටතේ වන ව්‍යවහාරයන් සඳහා වන වෙනස් කිරීම් තහවුරු කිරීමට ගනු ලබන අනෙකුත් ක්‍රියාමාර්ග කවරේද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද;

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 සැප්තැම්බර් මස 21 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1377/'11

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2001 වර්ෂයේදී ආරම්භ කළ මාතලේ සිරිමාවෝ බණ්ඩාරනායක ආදර්ශ ප්‍රාථමික විදුහලට අනුබද්ධව මේ වන විට ද්විතීයික අංශයක් ආරම්භ කර ඇති බවත්;

(ii) එම ද්විතීයික අංශය පිළිබඳව දෙමාපියන් අතර ගැටලු සහගත තත්ත්වයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසලේ ද්විතීයික අංශය සඳහා ඉදිකර ඇති තෙමහල් ගොඩනැගිල්ල පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ වන විට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සම්පූර්ණයෙන් නිම කර තිබේද;

(iv) ප්‍රාථමික අංශය හා ද්විතීයික අංශය අතර ඇති දුර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම අංශ දෙක අතර ඉදිවන ප්‍රවේශ මාර්ගයේ, පාලම ඉදි කිරීම, පඩි පෙළ සකස් කිරීම සහ මාර්ගය කොන්ක්‍රීට් ඇතිරීමට අදාළව වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම මාර්ගයේ ඉදිකිරීම් නියමිත ප්‍රමිතියෙන් පවතින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසලේ ද්විතීයික අංශය වෙනත් නමකින් හැඳින්වීමට යෝජනාකර තිබේද;

(ii) එසේ නම්, ඒ නම කුමක්ද;

(iii) ද්විතීයික අංශය ආරම්භ කර ඇති ස්ථානයේ දරුවන්ට ප්‍රමාණවත් ආරක්ෂාව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0977/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අඩු පහසුකම් සහිත පාසල් ලෙස හඳුනාගෙන තිබෙන පළාත් සභා සහ මධ්‍යම රජය යටතේ පවතින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් මුස්ලිම් පාසල් හා වතු පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාසල්වල දියුණුව උදෙසා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන වැඩ සටහන් දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1378/'11

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සී (C) වර්ගයේ පාසල්වල විදුහල්පති තනතුර සඳහා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියෙහි නිලධාරීන් පත් කළ යුතු බවත්;

(ii) එසේ නොමැති අවස්ථාවල විදුහල්පති සේවයේ 2 ශ්‍රේණියේ අයෙකු පත් කළ යුතු බවත්;

(iii) එසේ වුවද, මාතලේ අධ්‍යාපන කලාපය තුළ C වර්ගයේ පාසල් කිහිපයක විදුහල්පති තනතුරෙහි වැඩ ආවරණය කිරීම සඳහා ගුරු සේවයේ නියුතු අය පත් කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) C වර්ගයේ පාසල්වල විදුහල්පති තනතුරෙහි වැඩ ආවරණය කිරීමට ගුරු සේවයෙහි අයකු පත් කිරීම අනුමත කරන්නේද;

(ii) නොඑසේ නම්, එවැනි පත්කිරීමක් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iii) දැනට (අ)(iii) හි සඳහන් පත්කිරීම් සිදු කර ඇති පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) විදුහල්පති සේවයෙහි 1 ශ්‍රේණියේ නිලධාරිණියකවූ ආර්. එම්. යූ. එස්. එස්. රාජකරුණා මහත්මියට පාසලක් ලබා නොදී මාතලේ අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත කොට සිටින බව එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, එම විදුහල්පතිණියට සාධාරණය ඉටු කිරීමට ගන්නා පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 සැප්තැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1628/'11

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2002 සිට මේ දක්වා අධ්‍යාපන විද්‍යා පීඨවලින් පිට වූ ගුරුවරුන්ගෙන් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි නමුත් දැනට උතුරු මැද පළාතේ සේවය කරන ගුරුවරු සංඛ්‍යාව එක් එක් විෂයය අනුව කොපමණද;

(ii) එම ගුරුවරුන්ට උතුරු මැද පළාතෙන් නිදහස්වී තම පදිංචි ප්‍රදේශවලට ස්ථාන මාරු ලබා ගැනීම සඳහා ඔවුන් වෙනුවෙන් වෙනත් ගුරුවරුන් එම පළාතට යෙදවීම සම්බන්ධයෙන් අවධානය යොමු කොට තිබේද;

(iii) දුෂ්කර සේවය නිම කළ ඉහත සඳහන් ගුරුවරුන්ගේ සාධාරණ ඉල්ලීම් සලකා බලා ලබා දී ඇති ස්ථාන මාරුවීම් සංඛ්‍යාව කොපමණද;

(iv) එවැනි ඉල්ලීම් මත ස්ථානමාරු ලබා නොදුන් ගුරුවරුන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය කර ඇති මැදිහත්වීම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1536/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ, මස්කෙළිය නගරයේ ඇති කාණු පද්ධතිය වර්ෂ 40කට වඩා පැරණි බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කිසිදු අලුත්වැඩියාවක් සිදු නොකිරීම නිසා අබලන්ව ඇති මෙම කාණු පද්ධතියෙන් අපවිත්‍ර ජලය පිටතට උතුරා යෑමෙන් පැතිරීයන දුර්ගන්ධය හේතුවෙන් අවට පදිංචි ජනතාව මහත් අපහසුතාවයන්ට පත්වන බවත්;

(ii) එම තත්ත්වය ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යයට මහත් තර්ජනයක්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මාඋස්සාකැලේ ජලාශය ඉදිකිරීමේදි ජලයෙන් යටවූ මස්කෙළිය පැරණි නගරය වෙනුවට වර්ෂ 1968 දී ඉදිකළ මස්කෙළිය නව නගරයේ ඇති මෙම කාණු පද්ධතියේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන ලෙස අදාළ නිලධාරීන්ට, පළාත් පාලන ආයතනවලට හා පළාත් සභාවට නියෝග කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1630/'11

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංගමයට බදු පදනම යටතේ ගෙවීම සඳහා මිලදී ගත් මුළු බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ ගෙන්වා ඇති දිනයන් හා එක් එක් දිනයේදී ගෙන්වා ඇති බස් රථ සංඛ්‍යාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගෙන්වන ලද එක් බස් රථයක මිල කොපමණද;

(ii) මාසිකව එක් බස් රථයක් වෙනුවෙන් ගෙවිය යුතු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) බදු පදනම මත ඉහත බස්රථ මිලදී ගැනීමේදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1539/'11

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හබරාදුව අධ්‍යාපන කොට්ඨාසයට අයත්, පුස්සැල්කඩ ආදර්ශ කණිටු විදුහලේ වර්ෂ 2003 සිට 2010 දක්වා, එක් එක් වර්ෂය ආරම්භයේදී,

(i) ඒ ඒ ශ්‍රේණිවල සිටි සිසුන් සංඛ්‍යාව හා සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පළමුවැනි ශ්‍රේණියට අයදුම්පත් යොමුකළ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2004 න් පසු එම පාසලේ ප්‍රගතියක් ඇති වී තිබෙන බව පිළිගන්නේද;

(ii) එම ප්‍රගතිය සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1542/'11

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, දඹුල්ල නගරය මැදින් ගලා බසින තම්මැන්නා ඇළ පළල් කිරීමේ කටයුතු සිදුකරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ කටයුතු සිදු කරන ආයතනය කුමක්ද;

(iii) තම්මැන්නා ඇළ පළල් කිරීමේ කටයුතු පිළිබඳව ප්‍රදේශවාසීන් දැනුවත් කර තිබේද;

(iv) ඇළ පළල් කිරීම හේතුවෙන් ඇළ දෙපස පදිංචිකරුවන් විශාල පිරිසකගේ සින්නක්කර ඉඩම් කොටස් සහ එම ඉඩම්වල තිබූ වටිනා ගස් අහිමි වී ඇති බව පිළිගන්නේද;

(v) එසේ නම්, එම පදිංචිකරුවන්ට ඒ සඳහා වන්දි මුදලක් ලබා දීමට කටයුතු කරන්නේද;

(vi) වන්දි ලබා දීමට කටයුතු කරන්නේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1616/'11

ගරු මොහොමඩ් අස්ලම් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, කැකිරාව, ගනේවල්පොල ප්‍රදේශයේ උග්‍ර පානීය ජල හිඟයක් පවතින බවත්;

(ii) එම ප්‍රදේශයේ උල්පත් ජලය හා ළිං ජලය පානය කිරීමට නුසුදුසු බවට සෞඛ්‍ය නිලධාරීන් උපදෙස් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කලාවැව ජල යෝජනා ක්‍රමය යටතේ ජල නල එළීමේ කටයුතු ඉහත සඳහන් ප්‍රදේශයන්හි ගම්මානයන් ආවරණය වන පරිදි ව්‍යාප්ත නොකිරීම නිසා එම ප්‍රදේශවාසීන්ට පිරිසිදු පානීය ජල පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව අහිමිවී තිබෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා කඩිනම් විසඳුමක් ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2011 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා)**

1540/'11

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හබරාදුව අධ්‍යාපන කොට්ඨාසයට අයත්, හරුමල්ගොඩ බටහිර කණිෂ්ට විද්‍යාලයේ වර්ෂ 2003 සිට 2010 දක්වා, එක් එක් වර්ෂය ආරම්භයේදී,

(i) ඒ ඒ ශ්‍රේණිවල සිටි සිසුන් සංඛ්‍යාව හා සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පළමුවැනි ශ්‍රේණියට අයදුම්පත් යොමුකළ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2004 න් පසු එම පාසලේ ප්‍රගතියක් ඇති වී තිබෙන බව පිළිගන්නේද;

(ii) එම ප්‍රගතිය සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ඔක්තෝබර් මස 04 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1230/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ඔක්තෝබර් මස 05 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1231/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1204/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළට නීති විරෝධී අන්දමින් රැගෙන ඒමේදී අත්අඩංගුවට පත් වූ මත් ද්‍රව්‍ය (හෙරොයින් වැනි) ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නීති විරෝධී මත් ද්‍රව්‍ය මෙරටට ගෙන්වන ලද පුද්ගලයින්ගේ හෝ ආයතනවල නම් කවරේද;

(iii) නීති විරෝධී මත්ද්‍රව්‍ය රැගෙන ඒම සම්බන්ධව එම එක් එක් පුද්ගලයාගෙන් හෝ ආයතනයෙන් රජය විසින් අය කර ගන්නා ලද දඩ මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම මත්ද්‍රව්‍ය ගෙන්වා ඇති රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1234/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1205/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා හා බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එල්. ටී. ටී. ඊ. සංවිධානය සතු, මෙතෙක් ලංකාවට ගෙන්වා නොමැති නැව් මේ වන විට ගාල් කර ඇති හෝ සේවයෙහි යොදවා ඇති රටවල් හෝ නැව් සමාගම් කවරේද;

(ii) එම නැව් මෙරටට ගෙන්වා ගැනීම සඳහා කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1235/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ඔක්තෝබර් මස 06 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0960/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ භාවිතාවන දුරකථන ජාලයන් හරහා සිදුවන දෙබස්වලට සවන්දීම හෝ පටිගත කිරීම සඳහා උපකරණ පද්ධතියක් රජය හෝ යම් ආයතනයක් විසින් මෙරටට ගෙන්වා හෝ ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, එහි වටිනාකම කොපමණද;

(iii) එම පද්ධතිය මගින් ආවරණය වන දුරකථන සංඛ්‍යාව කොපමණද;

(iv) එවැනි පද්ධතියක් ගෙන්වීමේ අරමුණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1236/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1207/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරග මාලාවේ ශ්‍රී ලංකාව තුළ රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන අයිතිය ලබා ගත් මෙරට මාධ්‍ය ආයතන කවරේද;

(ii) එම අයිතිය සඳහා ඉල්ලුම් කළ අනෙකුත් මාධ්‍ය ආයතන කවරේද;

(iii) එම එක් එක් ආයතනය ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iv) එම විකාශන අයිතිය ලබා දුන් මාධ්‍ය ආයතන විසින් ඒ සඳහා ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1239/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් සමාජ සේවා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1208/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ 2011.02.19 වැනි දින පැවති කැනඩා - ශ්‍රී ලංකා ලෝක කුසලාන ක්‍රිකට් තරගය නැරඹීමට පැමිණි ප්‍රේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරගය නැරඹීම සඳහා එක් එක් මිල ගණන් යටතේ අලෙවි කළ ටිකට් පත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ටිකට් පත් අලෙවියෙන් ලැබූ ආදායම කොපමණද;

(iv) එම ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකයින් සඳහා ලබා දී ඇති පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ඔක්තෝබර් මස 07 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1041/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වන ග්‍රාමීය මට්ටමේ ප්‍රජා ජල යෝජනා ක්‍රම ව්‍යාපෘතිය සඳහා ලැබුණු ආධාර මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය යටතේ අවසන්කොට ඇති ජල යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(ii) අවසන් කළ ජල යෝජනා ක්‍රම පිහිටි ග්‍රාම නිලධාරී වසම් සහ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය යටතේ ඇරඹි, මෙතෙක් වැඩ අවසන්ව නොමැති ජල යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(iv) එම වැඩ අවසන් නොමැති ජල යෝජනා ක්‍රම පිහිටි ග්‍රාම නිලධාරී වසම් සහ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ග්‍රාමීය මට්ටමේ ප්‍රජා ජල යෝජනා ක්‍රම ව්‍යාපෘතිය අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1209/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ මේ දක්වා ලියාපදිංචි කර බලපත්‍ර ලබා දී ඇති මූල්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මූල්‍ය ආයතනවල නම් කවරේද;

(iii) මහ බැංකුව වෙත වාර්තා වී ඇති ලියාපදිංචි නොවී පවත්වාගෙන යනු ලබන මූල්‍ය ආයතන තිබේද;

(iv) එසේ නම්, ඒවායේ නම් කවරේද;

(v) එම ලියාපදිංචි නොකළ මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1313/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙහිවල පිහිටි සත්වෝද්‍යානය පින්නවල වෙත රැගෙන යාමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට එම ඉඩම් අත්පත් කරගෙන තිබේද;

(iv) දෙහිවල පිහිටි සත්වෝද්‍යානය පින්නවල වෙත මාරු කිරීම සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(v) ඉහත ස්ථාන මාරුව සිදුකිරීමට බලපෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යෝජිත සත්වෝද්‍යාන ස්ථාන මාරුව දැනට හුරු වී ඇති පාරිසරික තත්ත්වයට වඩා වෙනස් තත්ත්වයකට සතුන් නිරාවරණය කිරීමකට හේතුවන බවත්;

(ii) එම තත්ත්වය නිසා සත්වෝද්‍යානයේ සතුන්ගේ ජීවිත අවදානමට ලක්වන වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) සත්වෝද්‍යානයේ ස්ථාන මාරුව නිසා ඇතිවන ඉහත අවදානම් තත්ත්වය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ඔක්තෝබර් මස 18 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0756/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වන විට ගුරු වෘත්තියේ නියැළී සිටින, අධ්‍යාපන විද්‍යාපීඨවලින් පිටවූ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් අතරින් ශාස්ත්‍රවේදී උපාධි, විද්‍යාවේදී උපාධි, පශ්චාත් උපාධි, ශාස්ත්‍රපති උපාධි ආදී උපාධි තලයන් දක්වා උසස් අධ්‍යාපනය ලබා ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) ලබා ඇති එම උපාධි අනුව ගුරු සේවයේ ඒ ඒ ශ්‍රේණිවලට ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් පත්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) සබරගමුව පළාත් සභාවේ සේවය කරන ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුවරුන් උපාධි ලබා තිබේ නම්, ඔවුන්ගේ පත්වීම් උපාධිධාරී ගුරු පත්වීම් ලෙස සලකා ගුරු සේවයේ ආදාළ ශ්‍රේණිවල පිහිටුවීම සඳහා චක්‍ර ලේඛයක් එම පළාත් සභාව විසින් නිකුත්කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) අනෙකුත් ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් ලබාගත් උපාධි අනුව ගුරු සේවය තුළ උසස්වීම් ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0842/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010 එක්සත් ජාතීන්ගේ සමුළුව සඳහා සහභාගි වූ ජනාධිපතිවරයා ඇතුළු කණ්ඩායමේ සිටි සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමුළුව සඳහා එක් රටකට ලැබෙන නිල අවසර පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම කණ්ඩායම නවාතැන් ගත් ස්ථානයේ නම කුමක්ද;

(iv) එම සංචාරය වෙනුවෙන් වියදම් වූ මුළු මුදල කොපමණද;

(v) එම වියදම දරනු ලබන අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම සමුළුවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික අනෙකුත් රටවල්වලින් ඉදිරිපත් කළ නියෝජිත සංඛ්‍යාව එක් එක් රට අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1023/’10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ශ්‍රී ලංකාවේ උද්ධමනය ගණනය කිරීමට යොදාගන්නා වත්මන් ක්‍රමවේදය සෑහීමකට පත්විය හැකි මට්ටමක පවතින්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උද්ධමනය පාලනය කිරීමට වර්තමානයේ රජය විසින් ගනු ලබන පියවර කවරේද;

(ii) එම පියවර මගින් ප්‍රමාණවත් අන්දමින් උද්ධමනය පාලනය වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1314/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාව තුළ සේවය කරනු ලබන ස්ථිර හා අනියම් සිවිල් සේවකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සේවකයින්ට එක් මාසයක් තුළ අතිකාල දීමනා ලෙස ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) 2011 ජනවාරි මස සිට මේ දක්වා එම සේවකයින් වෙනුවෙන් නියමිත පරිදි අතිකාල දීමනා ගෙවා තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) 2011 ජනවාරි සිට මෙතෙක් ගෙවා නොමැති අතිකාල දීමනා ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1026/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2008, 2009 සහ 2010 යන වර්ෂවලදී ශ්‍රී ලංකාවට විදේශ ආයෝජන ලෙස ලැබුණු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් වර්ෂයේදී ප්‍රමාණවත් විදේශ ආයෝජන ශ්‍රී ලංකාවට ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1315/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාලු මුවදොර පිහිටි ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය ඉවත් කර, එය පිහිටි ඉඩම විදේශීය සමාගමක් වෙත විකුණා දැමීමට හෝ බදු දීමට කටයුතු කර තිබේද;

(ii) බදු පදනම මත ලබා දී ඇත්නම්, එසේ ලබා දී ඇති කාල සීමාව කොපමණද;

(iii) එම ඉඩම ලබා දී ඇති විදේශීය සමාගමෙහි නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ඉඩම ලබා දීමට අදාළ ගිවිසුම එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ඔක්තෝබර් මස 19 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0931/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) දකුණු පළාතේ පාසල්වල මේ වන විට වර්ෂ 10 කට ආසන්න කාලයක් ස්වේච්ඡා පදනම මත සේවයේ නියුක්ත ගුරු පිරිසක් කිසිදු දීමනාවක් නොලබා සේවය කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එලෙස සේවය කරනු ලබන ගුරුවරුන්ගේ නම් සහ සංඛ්‍යාව අධ්‍යාපන කලාප මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ගුරුවරුන් බඳවාගනු ලැබුවේ කවර විෂයයන් ඉගැන්වීම සඳහාද;

(iii) ඔවුන් බඳවාගත් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දිවයිනේ වෙනත් පළාත්වල සේවය කරන ලද ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, දකුණු පළාතේ ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1091/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාසිකව රුපියල් 1000 ට අඩු සමෘද්ධි සහනාධාරය ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) 2010 වර්ෂයේදී සමෘද්ධි සහනාධාරය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) 2011 වර්ෂයේදී සමෘද්ධි සහනාධාරය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මහින්ද චින්තනයේ සඳහන් පරිදි,

(i) රුපියල් 1000 ට වඩා අඩුවෙන් සමෘද්ධි සහනාධාර ලබන සෑම පවුලකම සමෘද්ධි දීමනාව රුපියල් 1000 දක්වා වැඩි කර තිබේද;

(ii) අවුරුදු 3ට අඩු දරුවන් සිටින සෑම පවුලකම දරුවන් වෙනුවෙන් රුපියල් 1500ක අතිරේක සහනාධාරයක් ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) සෑම සමෘද්ධි පවුල් ඒකකයකටම යම් ව්‍යාපාරයක් කරගෙන යාමට හෝ වෘත්තියක නියැලීමට අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දීම සඳහා රුපියල් 100,000 දක්වා ණය මුදලක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1040/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ දූප්පත්කම තුරන් කිරීම වෙනුවෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ක්‍රියාමාර්ග හරහා ආවරණය වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) දූප්පත්කම තුරන් කිරීමේ ඉලක්ක වර්තමාන රජයේ වැඩසටහන් තුළින් සාර්ථකව සපුරාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1316/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ හිල්ටන් හෝටලය රජයට පවරා ගනු ලැබූ දිනය කවදාද;

(ii) එය රජයට පවරා ගැනීමට හේතුවූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය නැවත එම එම හෝටලය විකිණීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා තීරණය කර ඇති වටිනාකම කොපමණද;

(iii) එය මිලදී ගනු ලබන පුද්ගලයා හෝ ආයතනය කවරේද;

(iv) එම ගනුදෙනුව සිදුකරනු ලබන්නේ බදු පදනම යටතේද; නැතහොත් ස්ථිර පදනම යටතේද;

(v) එම මිලදීගැනීම බලපවත්නා කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1274/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි කුඹුරු අක්කර එකසිය පනහකට පමණ ජලය සපයන වේකෙවිල අමුණ නිසි පරිදි නඩත්තු නොකරන බවත්;

(ii) එම හේතුවෙන් තම වගා කටයුතු සඳහා අවශ්‍ය ජලය සපයා ගැනීමට නොහැකිව එම ප්‍රදේශයේ ගොවීන් දැඩි අපහසුතාවට පත්ව සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වේකෙවිල අමුණ කඩිනමින් ප්‍රතිසංස්කරණය කොට ගොවීන්ගේ ජල අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1317/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය දැනට පවත්වාගෙන යනු ලබන ස්ථානය කවරේද;

(ii) එම ස්ථානය ස්ථිර හෝ බදු හෝ කුලී පදනම මත ලබාගෙන තිබේද;

(iii) කුලී පදනම මත ලබාගෙන ඇත්නම්, ඒ සඳහා මාසිකව ගෙවනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙනත් ස්ථානයක් වෙත රැගෙන යාමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම නව ස්ථානය කුමක්ද;

(iii) එම ස්ථානය බදු හෝ කුලී පදනම යටතේ ලබාගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා මාසිකව ගෙවිය යුතු මුදල කොපමණද;

(v) බදු හෝ කුලී පදනම මත එම ස්ථානය ලබා ගෙන ඇති කාල සීමාව කොපමණද;

(vi) එම ගොඩනැගිල්ලේ හිමිකරු කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ඔක්තෝබර් මස 20 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0957/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩමග හන්දියේ සිට වැල්තොට දක්වා මාර්ගය වර්ෂ ගණනාවක සිට අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් දැඩි සේ අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය අයත්වන ආයතනය කුමක්ද;

(ii) මෙම මාර්ගය ගමනාගමනයට සුදුසු ලෙස අලුත්වැඩියා කිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩ කටයුතු ආරම්භකරන දිනය හා අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම මුදල් මේ වන විට වෙන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1064/’11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009, 2010 වර්ෂවලදී සහ 2011 වර්ෂයේ මේ දක්වා ලැබී ඇති සමස්ත ණය සහ ප්‍රදානයන්ගේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් අයුරින් ලැබුණු ණය සහ ප්‍රදානයන් යොදගනු ලැබූ ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් අයුරින් ලබාගත් එක් එක් ණය මුදලට අදාළව,

(i) සියල්ල ඇතුළත් සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

(ii) ණය කාලසීමාව කොපමණද;

(iii) ණය කාලසීමාව අවසානයේදී ගෙවා ඇති සමස්ත පොලිය සහ ණය ගාස්තුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1318/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාලුමුවදොර පිහිටි ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය මේ වනවිට එම ස්ථානයෙන් ඉවත්කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) දැනට යුද හමුදා මූලස්ථානය පවත්වාගෙන යනු ලබන ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට යුද හමුදා මූලස්ථානයේ කටයුතු සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

(iii) එම එක් එක් ස්ථානයේ අයිතිකරුවන්ගේ නම්, ලිපිනයන් සහ මාසිකව ගෙවනු ලබන කුලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1276/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව බස් නැවතුම්පොළෙහි වහලය සහ අනෙකුත් උපකරණ විනාශ වෙමින් පවතින බවත්;

(ii) එම තත්වය හික්කඩුව ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සංචාරක ව්‍යාපාර වෙත විදේශ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා බාධාවක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බස් නැවතුම්පළ නොපමාව ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, මේ වනවිට ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) බස් නැවතුම්පළෙහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1343/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහරගම නගර සංවර්ධන සැලැස්ම යටතේ, තලවතුගොඩ නගරයේ ඉදිකරනු ලබන හරිත උද්‍යානය සහ ක්‍රීඩා පිටිය සඳහා වෙන් කළ භූමි ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉදිකිරීම් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) මේ වන විට එම ඉදිකිරීම් අවසන් කර තිබේද;

(iv) නොඑසේ නම්, මේ වන විට එම භූමිය කුමන කටයුත්තක් සඳහා භාවිතා කරනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ක්‍රීඩා පිටියට හා හරිත උද්‍යානයට වෙන් කළ ඉඩම වෙනත් කටයුත්තක් සඳහා භාවිතා කරන්නේ නම්, හරිත උද්‍යානය සහ ක්‍රීඩා පිටිය සඳහා වෙන් කළ මුදල කුමක් සඳහා භාවිතා කළේ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1284/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර - කොළඹ අධිවේගී මාර්ගයේ මාතර පිවිසුම් ස්ථානය වන ගොඩගම කුඩා නගරයක් වශයෙන් සංවර්ධනය කිරීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා පවරා ගැනීමට නියමිත භූමියේ වර්ග ප්‍රමාණය කොපමණද;

(iii) එම දේපල වෙනුවෙන් වන්දි ගෙවීමක් සිදු කරන්නේද;

(iv) වන්දිය ගෙවීම මුදලින් සිදු කරන්නේ නම්, එක් පර්චසයක් වෙනුවෙන් ගෙවනු ලබන මුදල කොපමණද;

(v) පවරාගත් නිවාස හා ඉඩම් වෙනුවෙන් නව නිවාස හා ඉඩම් ලබා දෙන්නේ නම්, ඒවා එම ප්‍රදේශයේ ඇතිවන සංවර්ධනයේ ප්‍රතිලාභ පහසුවෙන් ලබාගත හැකි ස්ථානවලින් ලබා දීමට කටයුතු කරන්නේද;

(vi) මේ වන විට ඉඩම් හා නිවාස ලබාදීමට සැලසුම් කර ඇති ප්‍රදේශ කවරේද;

(vii) එම ඉඩම් හා නිවාස අදාළ පුද්ගලයින්ට ලබා දෙනු ලබන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ඔක්තෝබර් මස 21 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0479/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය භාරය කවරේද;

(ii) සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලැබ ඇති, අභ්‍යන්තරික තැනැත්තන් විසින් සිදු කරන ලද වංචනික ගනුදෙනු සංඛ්‍යාව කොපමණද;

(iii) එම විමර්ශන කටයුතුවලට සම්බන්ධ නම් සහ සිද්ධි කවරේද;

(iv) මේ වන විට එම විමර්ශන කටයුතුවලින් ලැබී ඇති ප්‍රතිඵල කවරේද;

(v) එම සිද්ධි සමථයකට පත් කොට හෝ ඒ වෙනුවෙන් දඩ මුදල් අය කරනු ලැබ තිබේද;

(vi) අය කරනු ලැබූ දඩ මුදල් ප්‍රමාණයන් සහ එක් එක් පැමිණිල්ල සමථයකට පත් කරනු ලැබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0956/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර, පඹුරණ, සුමනසාර මාවත, අංක 35B දරන ලිපිනයේ පදිංචි ශාන්ති ප්‍රේමරත්න මහත්මිය සෞදි අරාබියේ රැකියාවක් සඳහා 2007.11.19 දින විදේශ ගත වූ බවත්;

(ii) දැනට වර්ෂ තුනක් ගතවී ඇතත් මේ දක්වා ඇය ගැන කිසිදු තොරතුරක් ලැබී නොමැති බවත්;

(iii) මේ පිළිබඳව ඇයගේ ස්වාමිපුරුෂයා වන සුසිල් ප්‍රේමරත්න මහතා මාතර විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පැමිණිලි කළ ද, ඊට කිසිදු ප්‍රතිචාරයක් මෙතෙක් ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශාන්ති ප්‍රේමරත්න මහත්මිය පිළිබඳව සොයා බලා ඇය ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1197/'11

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහ තුළ, එක් එක් වර්ෂයේ දී,

(i) සමස්ත බිත්තර පරිභෝජනය සහ ඒක පුද්ගල බිත්තර පරිභෝජනය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදන පිරිවැය කොපමණද;

(iii) ආනයනය කරන ලද බිත්තර ප්‍රමාණය කොපමණද;

(iv) ආනයනය කරන ලද බිත්තර ප්‍රමාණයෙහි වටිනාකම කොපමණද;

(v) බිත්තර ආනයනකරුවන් වෙත ලබාදුන් තත්‍ය සහනාධාරය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආනයනය කරනු ලබන බිත්තරවලට සහ දේශීයව නිෂ්පාදනය කරනු ලබන බිත්තරවලට පනවා ඇති සියලු සෘජු හා වක්‍ර බදු කවරේද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1285/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර - කොළඹ දුම්රිය මාර්ගය සංවර්ධන කටයුතු සඳහා සැලසුම් කර ඇති අදියර ගණන කොපමණද;

(ii) එම අදියර අතරින් ගාල්ල හා මාතර අතර දුම්රිය මාර්ග සංවර්ධන අදියර හැර අනෙකුත් අදියරයන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිපාදන සපයනු ලබන දේශීය හෝ විදේශීය ආයතන කවරේද;

(iv) එය විදේශීය වශයෙන් ලබා ගන්නා ණය මුදලක් නම්, ඒ සඳහා අය කරනු ලබන පොලී අනුපාතය කවරේද;

(v) එම ණය මුදල ගෙවා නිම කළ යුතු කාලසීමාව කොපමණද;

(vi) ණය සම්බන්ධයෙන් පනවා ඇති කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීමෙන් පසුව දුම්රිය ධාවනයේ ඇතිවන කාර්යක්ෂමතාව කොපමණ ප්‍රතිශතයකින් වැඩි වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1379/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීතිපති දෙපාර්තමේන්තුව ක්‍රියාත්මකවන්නේ කවර ආයතනයක්/පුද්ගලයකු යටතේද;

(ii) නීතිපති දෙපාර්තමේන්තුව සඳහා වර්ෂයකට ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත කාර්ය මණ්ඩලයේ එක් එක් කාණ්ඩය අනුව සේවක සංඛ්‍යාව බෙදී ඇති ආකාරය කවරේද; සහ

(v) ජ්‍යෙෂ්ඨත්වයේ අනුපිළිවෙළ අනුව නීතිපතිවරයාගේ සිට පහළට සිටිනා ජ්‍යෙෂ්ඨතම රජයේ අධිනීතිඥවරුන් 15 දෙනාගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නීතිපතිවරයා පත් කරනු ලබන්නේ නීතිපති දෙපාර්තමේන්තුව තුළින්මද; නැතහොත් ඉන් පරිබාහිරවද; සහ

(ii) නීතිපතිවරයා නීතිපති දෙපාර්තමේන්තුවට පරිබාහිරව පත් කරනු ලැබේ නම්, තෝරා ගැනීමේ නිර්නායක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1286/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට, උතුරු එක්නැලිගොඩ ප්‍රජා ජල යෝජනා ක්‍රමය මීට වර්ෂ 13කට පෙර ලෝක බැංකු ආධාර යටතේ ඉදිකළ ව්‍යාපෘතියක් බවත්;

(ii) මෙම ජල ව්‍යාපෘතියේ පවත්නා අකාර්යක්ෂමතා නිසා එමගින් ජල පහසුකම් ලබන ප්‍රදේශයේ ජනතාව දැඩි පානීය ජල හිඟයකින් පීඩා විඳින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය මගින් මේ වනවිට ජලය සපයනු ලබන ජල පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) අලුතින් ජල සැපයුම සඳහා ඉල්ලුම් කර ඇති පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) උතුරු එක්නැලිගොඩ ප්‍රජා ජල යෝජනා ක්‍රමය රජයට පවරා ගෙන වඩාත් කාර්යක්ෂම ලෙස ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

(iii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?